වාර්ෂික වාර්තාව

2021

SRI LANKA ACCREDITATION BOARD

අනුකූලතා තක්සේරු පිළිබඳ

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

ASIA PACIFIC ACCREDITATION COOPERATION

පටුන


| | පිටු අංකය |
|---|---|
| සභාපතිගේ පණිවිඩය | II |
| අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරිගේ සංශිප්තය | III |
| 1. හැඳින්වීම | 1 |
| 1.1. තත්ත්ව ප්‍රතිපත්තය, අපක්ෂපාතීත්ව ප්‍රතිපත්තය, දැක්ම, මෙහෙවර සහ වටිනාකම් | 2 |
| 1.2. ඉලක්ක, අරමුණු සහ උපාය මාර්ග | 5 |
| 1.3. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්යයන් | 7 |
| 2. පාලක සභාව | 8 |
| 3. ව්‍යවස්ථාපිත කමිටු | 10 |
| 3.1. විගණන ගමිටුව | 10 |
| 4. මෙහෙයුම් කළමණාකරණය | 11 |
| 4.1. මානව සම්පත | 11 |
| 4.2. කාර්යමණ්ඩලය | 11 |
| 5. කාර්යසාධන විශේෂතා 2021 | 12 |
| 5.1. ප්‍රතීතන සේවා | 12 |
| 5.2. පුහුණු වැඩසටහන් | 12 |
| 5.3. අන්තර්ජාතික කටයතුවලට සහභාගීවීම | 12 |
| 6. මූල්‍ය තොරතුරු 2021 | 14 |
| 6.1. 2021 වසර සඳහා මූල්‍ය විශේෂ අවස්ථා | 14 |
| 6.2. 2021 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 15 |
| 6.3. 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය | 18 |
| 6.4. 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 20 |
| 6.5. 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 22 |
| 6.6. මූල්‍ය ප්‍රකාශනයේ සටහන් | 24 |
| ඇමුණුම | |
| ඇමුණුම 01 - සංවිධාන සටහන | 48 |
| ඇමුණුම 02 - ක්‍රියාකාරීත්ව ව්‍යුහය 2021 | 49 |
| ඇමුණුම 03 - 2021 දෙසැම්බර් මස 31 වන දිනට සේවක තොරතුරු | 50 |
| ඇමුණුම 04 - සේවක පුහුණුව 2021 | 52 |
| ඇමුණුම 05 - පවත්වනලද පුහුණු වැඩසටහන් | 53 |

# සභාපතිගේ පණිවිඩය



ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය ලබා දෙන්නේ ඉමහත් සතුටිනි.

අනුකූලතා තක්සේරුව සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ (SLAB) ප්‍රධාන අරමුණ වන්නේ රසායනාගාර, සහතික කිරීමේ ආයතන සහ පරීක්ෂණ ආයතන ආදී අනුකූලතා තක්සේරු කිරීමේ ආයතනවලට ප්‍රතීතනය ලබා දීම හා ජාතික තත්ත්ව ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රතීතන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම, හා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතීතන පිළිවෙත්වල නිපුණතාවය සහතික කිරීම සහ දේශීය හා ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීම වේ.

NQI හි ප්‍රධාන සාමජිකයෙකු ලෙස, ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සහ සෞඛ්‍යයට අහිතකර සහ අනතුරුදායක භාණ්ඩ හා සේවා වලින් දේශීය පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ජාත්‍යන්තර රසායනාගාර සහයෝගීතාවයේ (ILAC) සහ ජාත්‍යන්තර ප්‍රතීතන සංසදයේ (IAF) සාමාජිකයෙකු වන බැවින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ලබා දෙන ප්‍රතීතනයන් ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගැනේ.

2020 වසර මුලදී, COVID-19 වසංගතය ආරම්භ වන විට අප විසින් මෙම වසංගතය මගින් ඇති කර ඇති ආර්ථික පසුබෑමේ ප්‍රමාණය දැන සිටියේ නැත. තවද 2021 වසර තුළදී පවා රට තුළ සමාජ-ආර්ථික පරිසරයේ ඇති කරන ලද සහ සෘජු බලපෑම් සහ අවශේෂ බලපෑම් අප තවමත් අත්විඳින අතර තවමත් ලොව පුරා ව්‍යාපාර කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කර ඇත. කෙසේ වෙතත්, මෙම නව අභියෝග සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය දක්වන ලද ප්‍රතිචාර විශිෂ්ට විය. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් නව වැඩ කිරීමේ ක්‍රම උපයෝගී කර ගනිමින් මෙම අභියෝගයට සාර්ථකව මුහුණ දී ඇත. COVID-19 වසංගතයේ ධනාත්මක ප්‍රතිඵල අත්වින්දෙමු, IAF හි අවශ්‍යතාවලට අනුකූල වෙමින් තක්සේරුකරණය සඳහා සැලසුම් කිරීම කර නිවසේ සිට වැඩ කිරීමේ ආකෘතියේ සිට දිගටම රාජකාරි සිදුකරන ලදී. අනපේක්ෂිත අනාගතය හේතුවෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සුහුරු ආයතනයක් බවට පත් කරවීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, දුරස්ථ තක්සේරු කිරීම් සහ නව සාමාන්‍ය තත්ත්වයට තම ශ්‍රම බලකාය අනුගත කිරීම සඳහා ආයෝජනය කර ඇත. එය මා විශ්වාස කරන පරිදි ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මෙතෙක් ගෙන ඇති හොඳම සහ දුෂ්කරම තීරණවලින් එකකි.

රටේ වසංගත සහ ආර්ථික පසුබෑමට එරෙහිව සටන් කිරීම සඳහා නව්‍ය ප්‍රවේශයන් සමඟ අනුකූලතා තක්සේරු කිරීමේ ආයතන සහ කර්මාන්ත සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ ඇගයීම් පැවැත්වීම සහ ප්‍රතීතනය ලබා දීමේ ප්‍රධාන කාර්යයන් සම්බන්ධයෙන් සිය මෙහෙයුම් දිගටම කරගෙන යාමට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සමත් විය.

සියලුම ක්‍රියාකාරකම්වල සාර්ථකත්වය සහතික කරමින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කණ්ඩායම වෙත තම දායකත්වය ලබා දුන් සියලුම සභා සාමාජිකයින්ට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. අපි 2020/21 මූල්‍ය වර්ෂය අවසන් කළ ආකාරය දෙස බලන විට, නොවැළැක්විය හැකි ලෙස, ලොව පුරා වෙනත් බොහෝ ව්‍යාපාර වසංගතයෙන් පීඩා විඳිද්දී අපගේ මුදල් ප්‍රවාහ සමතුලිත කිරීමට අපට හැකි වී තිබේ. සභාපතිවරයා වශයෙන්, මෙම අභියෝගාත්මක වසර තුළ අපගේ ගෞරවනීය කාර්ය සාධනය දැකීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

එමෙන්ම එම මුල් මාසවලට සාපේක්ෂව සිතාගත නොහැකි හැකි තරම් ධනාත්මකව සහ ශක්තිමත්ව වසර අවසන් කිරීම සඳහා දක්වන ලද සහයෝගය, කැපවීම සහ උනන්දුව සඳහා අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්යමණ්ඩලය සහ අපගේ සියලුම පාර්ශවකරුවන්ට මගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි.

**ආචාර්ය සම්පත් වාහල**

සභාපති

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

# අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරිගේ සංශිප්තය



ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් විසින් 2021 වසර තුළදී ද එහි මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු තවදුරටත් හඳුන්වා දීම නිසා කොවිඩ් වසංගතය මගින් ඇති කරන ලද අයහපත් බලපෑම අවම කරන ගැනීමට හැකි විය. 2021 වසර තුළදී ද ප්‍රතීතන තක්සේරු කටයුතු හා පුහුණු කටයුතු මාර්ගගතව සිදු කිරීම් මගින් සැලසුම් කරන ලද ඉලක්ක ළඟා කර ගැනීමට ප්‍රතීතන මණ්ඩලයට හැකියාව ලැබුණි. මීට අමතරව ආයතනයේ අනෙකුත් ප්‍රධාන කාර්යභාරයන් වන ප්‍රතීතනය පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම,ප්‍රතීතන කටයුතු සඳහා නියාමක ආයතනවල සක්‍රීය දායකත්වය ලබා ගැනීම, ආයතන කාර්යමණ්ඩලය සඳහා නිපුනතා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්ම තුලින් ආයතනයේ ධාරිතාව වැඩි කිරිමට කටයුතු කිරිම, මූල්‍ය තිරසාරත්වය ළගා කර ගැනීමට කටයුතු කිරිම, ප්‍රතීතනය සඳහා වන අන්තර්ජාතික පිළිගැනීම පවත්වාගෙන යාමට  කටයුතු කිරිම වැනි අනෙකුත් කාර්යන්ද සාධනීය ලෙස සිදු කිරිමට ආයතනයට හැකියාව ලැබුනි. මෙම ප්‍රගතිය අත්පත් කර ගැනීමට හැකියාව ලැබුනේ ආයතනයේ සේවක මණ්ඩලයේ දායකත්වය සහා බාහිර තක්සේරුවන් හා තාක්ෂණික විශේෂඥ සහයද ලබා ගැනීම තුලිනි.

2021 වසරේ ලෝක ප්‍රතීතන දිනය “තිරසාර සංවර්ධන ඉලක්ක සහ ජාතික කැපවීම - ප්‍රතීතනයේ කාර්යභාරය" යන තේමාව ඔස්සේ සාර්ථකව පැවැත්විණි. මෙම ජාතික වැඩසටහන සීමිත පිරිසකගේ සහභාගිත්වය සහ මාර්ගගත සජීවී විකාශනය තුලින් සහභාගී වීමේ පහසුකම සහිතව පැවැත්විමට  කටයුතු කරන ලදී. මෙම වැඩසටහනට සමගාමිව "SDG සඳහා ජාතික කැපවිම සහ ප්‍රතීතනය" යන මැයෙන් මාර්ගගත සංසදයක් පැවැත්වීමටද කටයුතු කරන ලදී. තවද සහශ්‍ර සංවර්ධන ඉලක්ක පිලිබඳව පෝස්ටර් තරගයක් පවත්වන ලද අතර ඊ පුවත් පත්‍රිකාවක් සහ SLAB ප්‍රවර්ධන අත්පොත නිකුත් කිරිමට  ප්‍රතීතන මණ්ඩලයට හැකි විය.

2021 වසර තුළ සිදු කරනු ලැබූ ප්‍රතීතන හා තක්සේරු බොහොමයක් මාර්ගගතව සිදු කරන ලද අතර,මෙම වසර තුලදි නව අනුකූලතා තක්සේරු ආයතන 13 ක් සඳහා ප්‍රතීතනය ලබා දීමට කටයුතු කර ඇත. මේ අතර පරික්ෂණ විද්‍යාගාර 04 ක්, භාණ්ඩ, පුද්ගලයින් සහතික කිරීමේ ආයතන 03 ක් වෛද්‍ය රසායනාගාර 02 ක්, ප්‍රවීණතා පරික්ෂණ සපයන්නන් 02 ක්, හරිතාගාර වායු වලංගුකරණ හා සත්‍යාපන ආයතන 02 ක් වේ. මීට අමතරව විවිධ ප්‍රමිතීන් සඳහා විෂයපථය  දිගු කිරීම් 14 ක් ලබා දීමට 2021 වසර තුලදී හැකිවී ඇත. මෙමගින් භාණ්ඩ හා සේවා නිෂ්පාදන ආයතන, අපනයනකරුවන් ආනයනකරුවන් සහ නියාමන ආයතන සඳහා අන්තර්ජාතිකව පිළිගත් ප්‍රතීතන සහතික ලබා ගැනිමට අවස්ථාව සලසා දිමට ප්‍රතීතන මණ්ඩලයට හැකි විය.

ප්‍රතීතන මණ්ඩලයේ තවත් එක් කාර්යභාරයක් වන ප්‍රතීතනය පිළිබදව විවිධ පුහුණු වැඩසටහන් පවත්වා කර්මාන්තකරුවන්, අනුකූලතා තක්සේරුකරුවන් ආනයන කරුවන් හා නියාමන ආයතන සඳහා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීමයි. මෙම වසර තුළ දී පුහුණු වැඩසටහන් 17 ක් පැවැත්වීමට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට හැකි විය. මීට අමතරව තක්සේරුකරුවන්, විවිධ කමිටු සාමාජිකයන්, සහා  අප කාර්යමණ්ඩලය සඳහා ද  නිපුනතා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි කරවීමට ආයතනය කටයුතු කරන ලදී. සහකාර අධ්‍යක්ෂකවරුන් කිහිප දෙනකුට සමතක්සේරුකරුවන් ලෙස පුහුණුව ලබා දීම සඳහා  APAC  ආයතනයට නම් කරන ලදී.

සහශ්‍ර සංවර්ධන ඉලක්කයන් හා ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, නියාමක ආයතන ප්‍රතීතන කටයුතු වලට දායක කර ගැනීම සඳහා කටයුතු කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ජාතික  කාබනික පාලන ඒකකය, කෘෂිකර්ම අමාත්‍යාංශය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වැනි නියාමන ආයතන සමඟ 2021 වර්ෂයේදී තාක්ෂණික රෙගුලාසි සඳහා ප්‍රතීතනය යොදා ගැනීම පිළිබඳව වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

ප්‍රතීතනය සඳහා ආයතනය ලබාගෙන තිබෙන අන්තර්ජාතික පිළිගැනීම පවත්වාගෙනයාම සඳහා SLAB ආයතනයේ සියලු කාර්යභාරයන් ISO/ IEC 17011:2017 අන්තර්ජාතික ප්‍රමිතියට අනුකූලව පවත්වාගෙනයාමට කටයුතු කර ඇත. ජාතික තත්ත්ව යටිතල ව්‍යූහයේ ප්‍රධාන පාර්ශව ආයතනයක් ලෙස 2021 වසර තුළදී අන්තර්ජාතික පිළිගැනීමක් සහිත ප්‍රතීතන සේවා ලබා දීම තුළින්, අන්තර්ජාතික වෙළඳාම ප්‍රවර්ධනට හා භාණ්ඩ හා සේවා භාවිතා කරන්නන්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සඳහා දායකත්වය ලබා දීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයකි.

තවද 2021 වසර තුළදී, SLAB කාර්ය ප්‍රවාහ ඩිජිටල් කරනය සඳහා අවශ්‍ය මූලික සැලසුම් සකස් කරන ලදී. මෙම ඩිජිටල්කරන ක්‍රියාවලිය අප ආයතනය වර්තමානයේ මුහුණ දී ඇති මානව සම්පත් හිඟ කම යම් තරමකින් පියවා ගැනීමට දායක වනු ඇතැයි අප ආයතනය බලාපොරොත්තු වේ.

2020 වසර හා සැසඳීමේදී 2021 වසර තුළ දී රුපියල් මිලියන 49.35 ක මෙහෙයුම් ආදායමක් ලබා ගැනීමට අප ආයතනයට හැකි වූ අතර මෙය 2020 වසර හා සැසඳීමේදී රුපියල් මිලියන 12.37ක වැඩි වීමකි.

**චන්ද්‍රිකා තිලකරත්න**

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

# 1. හැඳින්වීම

2005 අංක 32 දරණ පනත මගින් ස්ථාපිත ප්‍රතීතනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ කටයුතු කරන එකම අධිකාරී බලය හිමි ආයතනය අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය පාලනය කරනු ලබන්නේ පනතේ විධිවිධාන අනුව පත් කරන ලද සාමාජිකයින් දහතුන් දෙනෙකුගෙන් (13) සමන්විත පාලක සභාවක් මගිනි. අමාත්‍යවරයා විසින් පාලක සභාවේ එක් සාමාජිකයෙකු සභාපතිවරයා ලෙස පත් කරයි. පාලක සභාවේ ලේකම් වරයා ලෙය අධ්‍යක්ෂවරයා කරටයුතු කරන අතර ඔහු/ ඇය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ද වේ.

දේශීය සහ අපනයන වෙළෙඳපොළ සඳහා භාණ්ඩ හා සේවා සැපයීමේදී අනුකූලතා තක්සේරු කිරීම් පහසු කිරීම සඳහා ප්‍රතීතන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ අවශ්‍ය ප්‍රතීතන සේවා සැපයීම මණ්ඩලයේ වගකීම වේ. ප්‍රධාන ප්‍රතීතන සේවා අතරට පරීක්ෂණ/ වෛද්‍ය පර්යේෂණ/ ක්‍රමාංකන රසායනාගාර ප්‍රතීතනය, පද්ධති/ නිෂ්පාදන සහ පුද්ගලයින් සහතික කිරීමේ ආයතන, පරීක්ෂණ ආයතන, හරිතාගාර වායු වලංගු කිරීමේ සහ සත්‍යාපන ආයතන, නිපුණතා පරීක්ෂණ සේවා සපයන්නන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත අනුව 2005 සැප්තැම්බර් 23 වන දින සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී. ISO/IEC 17011:2017 (අනුකූලතා තක්සේරු ආයතන ප්‍රතීතනය කිරීම සඳහා ප්‍රතීතන ආයතන සඳහා වන අවශ්‍යතා) ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතීතන සහයෝගිතා අන්‍යෝන්‍ය පිළිගැනීමේ එකඟතාවය (ILAC MRA), ජාත්‍යන්තර ප්‍රතීතන සංසදය බහු පාර්ශ්වයීය එකඟතාවය (IAF MLA) සහ ආසියා පැසිෆික් ප්‍රතීතන සහයෝගීතාව අන්‍යෝන්‍ය පිළිගැනීමේ එකඟතාවය (APAC MRA) සඳහා අත්සන් කර ඇති ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතීතන සේවාවන් සිය සේවාලාභීන්ට ලබා දෙයි.

## 1.1. තත්ත්ව ප්‍රතිපත්තිය, අපක්ෂපාතීත්ව ප්‍රතිපත්තිය, දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

**තත්ත්ව ප්‍රතිපත්තිය**

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය එහි සේවා ලාභීන්ට උපරිම අවංක භාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් ප්‍රතීතන සේවා ලබාදීමට බැඳී ඇති සේවා ආයතනයකි.

ගනුදෙනුකරුවන් හා ප්‍රතීතනය පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව වල ව්‍යාපාරික පරිසරයේ වෙනස් වන අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ජාත්‍යන්තර ප්‍රමිති හා ප්‍රතිපත්ති වලට අනුව ප්‍රතීතන සේවා ලබා දීමට බැඳී සිටී.

ජාත්‍යන්තර පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ආයතන සමග ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය එලදායී ලෙස කටයුතු කරනු ලබයි.

අනුකූලතා තක්සේරු හා ප්‍රතීතන සේවා සම්බන්ධව වෙළෙඳපල පරිසරයේ ඇති ඉල්ලුම හා අවශ්‍යතාවලට අදාල වැඩිදියුණුකිරීම් සඳහා වන වෙනස් කිරීම් වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය නිරතුරුව එහි ක්‍රියාකාරීත්වය සමාලෝචනයට භාජනය කරනු ලබයි.

## අපක්ෂපාතීත්ව ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රධාන අරමුණු වන්නේ 2005 අංක 32 දරන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත යටතේ එය ස්ථාපිත කර ඇති කාර්යය සඳහා ශ්‍රී ලංකා රජය විසින් පවරා ඇති රාජකාරි ඉටු කිරීමයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය තම සේවා වලට අදාළ සමස්ත ප්‍රතිපත්ති සහ උපාය මාර්ග එකිනෙක වෙනස් කොට සැලකීමකින් තොරව සැමට අපක්ෂපාතීව සැලකීමේ ප්‍රතිපත්තිය පදනම් කොටගෙන ස්ථාපිත කර ඇත. ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සැකසීමේ ක්‍රියාවලියේදී සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහතික කර වෙනස් කොට සැලකීමකින් තොරව ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ පාලක සභාව සතු වේ.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ සේවක මණ්ඩලය සහ එය මගින් ස්ථාපිත කොට ඇති විවිධ කමිටු අපක්ෂපාතීත්වයට බාධා පමුණුවන සහ අභ්‍යන්තරයෙන් බාධා පැමිණියහැකි ඕනෑම ගැටුමක් හෙළිදරව් කළ හැකි අනවශ්‍ය වාණිජ, මූල්‍ය සහ වෙනත් පීඩනයකින් තොරව ස්වාධීනව තම ක්‍රියාකාරකම් සහ කාර්යයන් ඉටු කරන බව සහතික කෙරේ. ප්‍රතීතනයට අදාළ තීරණ ගනු ලබන්නේ ඇගයීම් සිදු කරන අයගෙන් වෙනස් වූ එම ක්ෂේත්‍රයේ නිපුණතාවයක් ඇති පුද්ගලයින් හෝ කමිටු විසිනි.

ප්‍රතීතනය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හැරුණු විට, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතීතන අධිකාරිය ලෙස ප්‍රතීතනය සඳහා අයදුම් කිරීමට අදහස් කරන ආයතනවලට ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතීතන අධිකාරිය වශයෙන් ගත හැකි තීරණවලට බලපෑ හැකි කරුණු සම්බන්ධයෙන් කිසිදු උපදේශන කටයුත්තක් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය කිසිදු තත්වයක් යටතේ සිදු නොකරනු ඇත.

# දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

## දැක්ම

“ජාතික ආර්ථිකයට හා සමාජ සුබසාධනයට දායක වෙමින් ක්‍රියාකාරි හා නවෝත්පාදන ප්‍රතීතන ආයතනයක් ලෙස ජාත්‍යන්තර පිළිගැනීමට ලක් කිරීම”

## මෙහෙවර

“දේශීය හා විදේශීය වෙළඳපොළ සඳහා භාණ්ඩ හා සේවා සැපයීමේදී අනුකූලතා තක්සේරු මගින් ජාත්‍යන්තර පිළිගැනීම පහසු කරවන අයුරින් ප්‍රතීතන සේවා ප්‍රවර්ධනය හා සැපයීම අපි කරන්නෙමු”

## වටිනාකම්

- **ඍජු හා ඉහළම සදාචාරමය හැසිරීම් රටාවක් තුළ සේවා සැළසීම.**
- **දිගින් දිගට ඉගෙන ගැනීම.**
- **ඇල්මක් ඇති පාර්ශවයන්ගේ විශ්වාසය තහවුරු වන අයුරින් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම.**
- **ස්වාධීන හා පක්ෂගග්‍රාහී නොවී කටයුතු කිරීම.**

## 1.2. ඉලක්ක, අරමුණු සහ උපාය මාර්ග

| | ප්‍රධාන විෂය පථය | ඉලක්ක / අරමුණු | මූලික අරමුණු | KPI |
|---|---|---|---|---|
| 1. | විවිධ පාර්ශවකරුවන් අතර ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීම | 1. ප්‍රතීතනය සහ එහි ප්‍රතිලාභ පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම | 1. ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ රැස්වීම්<br>2. පුහුණු වැඩමුළු/වෙබිනාර්<br>3. ජන මාධ්‍ය/වෙබ් අඩවිය/සමාජ මාධ්‍ය භාවිතය තුළින් දැනුවත් කිරීම් | 1. දැනුවත් කරන ලද සංවිධාන/පුද්ගලයින් ගණන<br><br>2. නව ප්‍රතීතන යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත් කරන ලද කර්මාන්ත/ අනුකූලතා තක්සේරු ආයතන සංඛ්‍යාව |
| | | 2. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ජාතික තත්ත්ව යටිතල පහසුකම් ව්‍යුහය තුළ ස්ථානගත කිරීම | 1. යෝජිත ජාතික තත්ත්ව සභාව (NQC) යටතේ SLAB සහ අනෙකුත් NQI ආයතන ස්ථානගත කිරීම සඳහා බලපෑම් ඇති කිරීම | |
| | | 3. SLAB සන්නාමය ප්‍රවර්ධනය කිරීම | 1.SLAB සන්නාමය රට තුළ සහ ඉන් පිටත ප්‍රවර්ධනය කිරීම | 1. සන්නාම ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ගණන |
| 2. | අපක්ෂපාතීත්වය සහතික කරමින් ප්‍රතීතනය පුළුල් කිරීම | 1. පවතින ප්‍රතීතන යෝජනා ක්‍රමවල සේවාදායකයින් සංඛ්‍යාව වැඩි කිරීම | 1. ප්‍රතීතනයට අදාල වෙළඳපල බුද්ධිමය ජාලය ශක්තිමත් කිරීම.<br>2. වෙළෙඳපොළ ප්‍රවර්ධනය<br>3. ජාතික/ ජාත්‍යන්තර ප්‍රතීතන යෝජනා ක්‍රම හිමිකරුවන් සමග අවබෝධතා ගිවිසුම් ඇති කර ගැනීම. | 1. සේවාලාභීන් සංඛ්‍යාවේ ප්‍රතිශතය වැඩිවීම<br>2. විෂය පථය දිගු කිරීම් ගණන<br>3. හඳුන්වා දුන් නව ප්‍රතීතන යෝජනා ක්‍රම ගණන |
| | | 2. පවතින සේවාදායකයින්ගේ විෂය පථ ගණන වැඩි කිරීම | | |
| | | 3. නව ප්‍රතීතන යෝජනා ක්‍රම හඳුන්වා දීම | | |
| 3. | ප්‍රතීතනය කිරීමේදී නියාමකයන්ගේ ක්‍රියාකාරී මැදිහත්වීම | 1. නියාමකයින් විසින් පිළිගත් අනුකූලතා තක්සේරු සේවා භාවිතය ප්‍රවර්ධනය කිරීම<br>2. SLAB ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතීතන සේවා සඳහා ඔවුන්ගේ රෙගුලාසිවල SLAB ප්‍රතීතනය ලත් සේවාවන් සඳහන් කිරීමට නියාමකයින් දිරිමත් කිරීම | 1. නියාමකයින් ඉලක්ක කර ගනිමින් සාදන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>2. SLAB හි තීරණ ගැනීමේ කමිටුවල නියාමකයින්ගේ නියෝජනය ලබා ගැනීම.<br>3. නියාමකයින් ඔවුන්ගේ රෙගුලාසිවලට අදාළ ඔවුන් විසින් යොදාගෙන ඇති ප්‍රතීතන යෝජනා ක්‍රම සමඟ සිතියම්ගත කිරීම සහ පෙළගැස්වීම<br>4.නියාමක සම්බන්ධීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 1.SLAB සමග කටයුතු කරන නියාමකයින් සංඛ්‍යාව<br>2. පිළිගත් අනුකූලතා තක්සේරු සේවා භාවිතා කිරීමට ඒත්තු ගැන්වූ නියාමකයින් සංඛ්‍යාව<br>3. ප්‍රතීතනය ලත් අනුකූලතා තක්සේරු සේවා සඳහන් කරමින් නිකුත් කරන ලද රෙගුලාසි ගණන |
| 4. | පුද්ගල නිපුණතා සංවර්ධනය සහ හිතකර සේවා පරිසරයක් ඇති කර ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම | 1. ප්‍රතීතනයේ පුළුල් වන අවශ්‍යතා සපුරාලීම සඳහා ආයතනයේ තාක්ෂණික ධාරිතාව පුළුල් කිරීම | 1. පවතින මානව සම්පත් සංවර්ධනය සහ නව කාර්ය මණ්ඩල බඳවාගැනීමට ක්‍රියා කිරීම.<br><br>2. සුදුසු තාක්‍ෂණය, නෛතික, පාරිසරික සහ සමාජීය තත්ත්ව වැඩිදියුණු කිරීම් සමඟින් සුහුරු ආයතනයක් බවට පත් කිරීම. | 1. ලබා දුන් නව නිපුණතා ප්‍රමාණය<br>2. නව තාක්ෂණික, නීතිමය සහ සමාජීය වැඩිදියුණු කිරීම් ගණන |
| | | 2. හිතකර සේවා පරිසරයක් සහ කාර්ය මණ්ඩල සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | |
| 5. | මූල්‍ය හා පාරිසරික තිරසාරභාවය සහතික කිරීම | 1. SLAB ආයතනය මූල්‍යමය වශයෙන් ස්ථාවර සහ තිරසාර භාවයට පත් කිරීමට කටයුතු කිරීම. | 1. වත්මන් ප්‍රතීතන යෝජනා ක්‍රමවල සේවාදායක පදනම වැඩි කිරීම<br>2. වෙළෙඳපොළ ඉල්ලුම මත නව ප්‍රතීතන යෝජනා ක්‍රම හඳුන්වා දීම | 1. වත්මන් ප්‍රතීතන යෝජනා ක්‍රම හරහා ආදායම ඉපයීමේ ප්‍රතිශතය වැඩි වීම |

| | | | | |
|---|---|---|---|---|
| | | | 3. පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම<br>4. SLAB හි විෂය පථය තුළ නව ආදායම් උපයන ව්‍යාපාර හඳුනා ගැනීම | 2. පුහුණු වැඩසටහන් හරහා ආදායමේ ප්‍රතිශතය වැඩි වීම |
| | | **2. වඩාත් යහපත් පාරිසරික භාවිතයන් හඳුන්වා දීම.** | 1.බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම<br>2.දේශගුණික හිතකාමී වැඩසටහන්<br>3. ද්‍රව්‍ය භාවිතය කාර්යක්ෂමතාව<br>4. හරිත වාර්තාකරණය ප්‍රවර්ධනය කිරීම. | 1. බලශක්ති භාවිතයේ ප්‍රතිශතය අඩු වීම<br>2. ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිශතය අඩු වීම<br>3 GHG විමෝචනයේ ප්‍රතිශතය අඩු වීම |
| 6. | ප්‍රතීතන ඇගයීම්වල අපක්ෂපාතීත්වය රැකගනිමින් ප්‍රතීතනය සඳහා ජාත්‍යන්තර පිළිගැනීම පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම. | **1.SLAB ප්‍රතීතනය ලබා ගත් අනුකූලතා තක්සේරු ආයතන විසින් නිකුත් කරන ලද අනුකූලතා තක්සේරු වාර්තා සඳහා ජාත්‍යන්තර පිළිගැනීම සහතික කිරීමට කටයුතු කිරීම.** | 1. SLAB ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීමේදී, වත්මන් ගැටළු, නව අවශ්‍යතා සහ සුදුසු විසඳුම් හඳුනා ගැනීම සඳහා අදාළ සංවිධාන (EDB, වාණිජ දෙපාර්තමේන්තුව, අපනයනකරුවන්ගේ සංගම්, ප්‍රතීතනය ලත් CABs, සාමාජික ABs) සමඟ ජාලගත කිරීම.<br><br>2. ජාත්‍යන්තර ප්‍රතීතන සංවිධානවල අදාළ සංසදවල නියෝජනය, සම ඇගයීම්, පුහුණු කිරීම් සහ SLAB ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීම.<br><br>3. SLAB හි වත්මන් ජාත්‍යන්තර පිළිගැනීමේ තත්ත්වය වැඩිදියුණු කිරීම. | 1. SLAB මැදිහත්වීමෙන් විසඳා ඇති ප්‍රතීතනය ලත් සහතික/වාර්තා පිළිබඳ ගැටළු සංඛ්‍යාව<br>2. නව MLA/MRA සඳහා අයදුම්පත්<br>3. නව MRA/MLA පිළිගැනීම්.<br><br>4. සහභාගී වූ රැස්වීම්/සංසද ගණන |
| | | 2. කලාපීය සහ ගෝලීය මට්ටමේ ප්‍රතීතන වර්ධනයන් සඳහා දායක වීම | 1 APAC සම ඇගයීම්වලට සහභාගී වීම.<br>2. රැස්වීම්/කමිටුවලට සහභාගී වීම<br>3. පුහුණු වැඩසටහන් වල සම්පත් දායකයකන් ලෙස සහභාගී වීම. | 1. සහභාගී වූ සම ඇගයීම්, රැස්වීම්, කමිටු සංඛ්‍යාව |

## 1.3. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්යයන්

- ජාත්‍යන්තර සහ ජාතික ප්‍රමිතීන්ට අනුකූලව, අනුකූලතා තක්සේරු ආයතන සඳහා ප්‍රතීතනය ලබා දීම.
    - පරීක්ෂණාගාර (ISO/IEC 17025)
    - ක්‍රමාංකන රසායනාගාර (ISO/IEC 17025)
    - වෛද්‍ය රසායනාගාර (ISO 15189)
    - පද්ධති සඳහා සහතික කිරීමේ ආයතන (ISO/IEC 17021)
    - නිෂ්පාදන සඳහා සහතික කිරීමේ ආයතන (ISO/IEC 17065)
    - පුද්ගලයන් සඳහා සහතික කිරීමේ ආයතන (ISO/IEC 17024)
    - වලංගු කිරීමේ හා සත්‍යාපන ආයතන (ISO/IEC 17029)
    - හරිතාගාර වායු (GHG) වලංගු කිරීමේ/සත්‍යාපන ආයතන (ISO 14065)
    - පරීක්ෂණ ආයතන (ISO/IEC 17020)
    - ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන් (ISO/IEC 17043); හා
    - හොඳ රසායනාගාර පරිචයන් සඳහා පුහුණුව (GLP)

- ජාතික තත්ත්ව ප්‍රතිපත්තියේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රතීතන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.

- අදාළ පාර්ශවකරුවන් සඳහා තක්සේරු පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පැවැත්වීම

- අනුකූලතා තක්සේරුව සම්බන්ධයෙන් සහයෝගීතාවය සහ සම්බන්ධතා සඳහා ජාතික සංසදය ලෙස කටයුතු කිරීම.

- තාක්ෂණික දැනුම ප්‍රවර්ධනය කිරීම සහ බෙදා හැරීම තුළින් ප්‍රතීතන පරිචයන් සහ තක්සේරු ක්‍රියා පටිපාටිවල නිපුණතාවය ඇති කිරීම.

- ප්‍රතීතනය සඳහා ජාතික පද්ධති සඳහා සහාය වීම සහ සංවර්ධනය කිරීම.

- සමාන විදේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ ගිවිසුම් අත්සන් කිරීම.

- ප්‍රතීතනය ලබා දීම, විෂය පථය දිගු කිරීම, විෂය පථය අඩු කිරීම, ප්‍රතීතනය අත්හිටුවීම හෝ ඉවත් කර ගැනීම සඳහා අනුකූලතා සහ සාක්ෂි තක්සේරු කිරීම් සංවිධානය කිරීම, කළමනාකරණය කිරීම සහ පැවැත්වීම.

## 2. පාලක සභාව

2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් දහතුන් දෙනෙකුගෙන් (13) සමන්විත පාලක සභාව වෙත මණ්ඩලයේ බලතල සහ කාර්යයන් පැවරී ඇත. අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා සෑම මසකම පාලක සභාව රැස්වේ.

2021 දෙසැම්බර් 31 වන දිනට පාලක මණ්ඩලයේ සංයුතිය පහත පරිදි විය.

ආචාර්ය සම්පත් වාහල – සභාපති

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය.

ආර් එම් එස් පී එස් බණ්ඩාර මහතා- සාමාජික

අධ්‍යක්ෂ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින්

ආචාර්ය සිද්ධිකා සේනාරත්න මිය - සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

එස් එන් අකුරන්තිලක මහතා- සාමාජික

අධ්‍යන්ෂ ජනරාල්,
මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව,

එම් එම් ජී කේ මීගහකොටුව මිය - සාමාජික

අධ්‍යක්ෂ (තාක්ෂණ හා පර්යේෂණ)
විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

නිරංජන් දිසානායක මහතා- සාමාජික

ෆෙරේරෝ සන්නාම ශ්‍රී ලංකා කළමණාකරු

මහාචාර්ය සරත් කොටගම මහතා- සාමාජික

සම්මානිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය

ගිල්මා දහනායක මහත්මිය - සාමාජික

අතිරේක ලේකම්, වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

රුවන් ද සිල්වා මහතා - සාමාජික

වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (FCCI).

# 1. ව්‍යවස්ථාපිත කමිටු

## 3.1. විගණන කමිටුව

විගණන කමිටුව විධායක නොවන පාලක මණ්ඩල සභිකයින් තුන් දෙනෙකුගෙන් හා විගණකාධිපති නියෝජනය කරමින් නියෝජිතයෙකුද මණ්ඩලයේ අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී (කමිටු ලේකම්) සහකාර අධ්‍යක්ෂ මුදල් හා පාලන, අභ්‍යන්තර විගණක යන අයගෙන් සමන්විත වේ. පාලක සභාවේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන නියෝජිතයා කමිටුවේ සභාපතිත්වය හොබවයි.

කමිටුවේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ ඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා සහ එහි බාහිර මූල්‍ය වාර්තාකරණ වගකීම් ඉටු කිරීම හා එහි වගකීම් ඉටුකිරීමේදී පාලක සභාවට සහාය වීමයි. **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය** සතුව ස්වාධීන අභ්‍යන්තර විගණන ක්‍රියාවලික් ඇති අතර එය විගණන කමිටුවට වාර්තා කරයි. බාහිර විගණන කටයුතුවල සඵලතාවය අධීක්‍ෂණය කිරීම සහ කවුන්සිලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ද කමිටුවේ වගකීම වේ.

මෙම කමිටුව වසර තුළදී රැස්වීම් 02ක් පවත්වා ඇති අතර **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය** ආයතනයේ අභ්‍යන්තර විගණක සහ විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද සියලුම වාර්තා සමාලෝචනය කරන අතර සියලුම විගණන කමිටු රැස්වීම්වල වාර්තා පාලක සභාවේ රැස්වීම්වලදී සභාගත කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා | සභාපති/ මහා භාණ්ඩාගාරය | මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින්, |
| එම්.එම්.ජී.කේ.මීගහකොටුව මිය | සාමාජික/ පාලක සභික | විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය නියෝජනය කරමින්, |
| ගිල්මා දහනායක මිය | සාමාජික/ පාලක සභික | වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය |
| නිරන්ජන් දහනායක මහතා | සාමාජික/ පාලක සභික | ෆෙරේරෝ සන්නාම ශ්‍රී ලංකා කළමණාකරු |
| සඳුනිමා පෙරේරා මිය | නිරීක්ෂක | විගණකාධිපති නියෝජනය කරමින් |
| පී. ඒ. රෝහණ මයා | නිරීක්ෂක | රේඛීය අමාත්‍යාංශය, අභ්‍යන්තර විගණක |
| චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය | ලේකම් | අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී, **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය** |
| හර්ෂා චන්ද්‍රසිරි මහත්මිය | ආරාධිත | සහකාර අධ්‍යක්ෂ (මුදල් සහ පරිපාලක) වැඩ බලන. **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය** |
| ටී. වනිගසුන්දර මහත්මිය | කැඳවුම්කරු | අභ්‍යන්තර විගණක, **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය** |

# 4. මෙහෙයුම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණේඩලයේ කළමනාකරණ කාර්යයන් අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී තනතුරට පැවරී ඇති අතර ඇමුණුම 01 හි දක්වා ඇති ආයතනික ව්‍යුහයේ දැක්වෙන පරිදි තාක්ෂණික, මූල්‍ය සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව මණ්ඩලයේ සියලුම විධායක කාර්යයන් සිදු කිරීම සඳහා අධ්‍යක්ෂවරයා කටයුතු කරයි.

## 4.1. මානව සම්පත්

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ මානව සම්පත සමන්විත වන්නේ සීමිත අභ්‍යන්තර කාර්ය මණ්ඩලයකින් සහ ශාස්ත්‍රීය හා විවිධ වෘත්තීය ආයතන වලින් ලබාගත් තක්සේරු කරුවන්ගේ සංචිතයකිනි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය අනුකූලතා තක්සේරු ආයතනවල නිපුණතාවය සහතික කිරීම සම්බන්ධයෙන් කටයුතු කරයි. වසර ආරම්භයේ සිටම කාර්ය මණ්ඩල පිරිවැටුම, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයට දැඩි ලෙස බලපෑ නමුත් කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීම මත, අනෙකුත් විදේශීය ප්‍රතීතන ආයතන හා සමානව එහි ප්‍රතීතන පද්ධති පවත්වාගෙන යාමට සමත් විය. සාමාන්‍යයෙන්, නව නිලධාරියෙකුට ස්වාධීනව වැඩ කිරීම සඳහා පත් කිරීමට පෙර අදාළ ක්ෂේත්‍රයක නිපුණතාවයක් දැක්වීමට අවම වශයෙන් වසර තුනක් අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල කාර්ය මණ්ඩලය සඳහා 2021 වසරේදී ලබා දී ඇති පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර ඇමුණුම 04 හි දක්වා ඇත.

## 4.2. කාර්ය මණ්ඩලය



# 5. කාර්ය සාධනය 2021

2021 වසර වන විට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වසර 16 ක මෙහෙයුම් සම්පූර්ණ කර ඇත. අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම්ව පරීක්ෂණ සහ ක්‍රමාංකන රසායනාගාර, වෛද්‍ය රසායනාගාර, සහතික කිරීමේ ආයතන සහ පරීක්ෂණ ආයතන වෙත ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සිය සේවාවන් අඛණ්ඩව ලබා දීම සිදු කරයි. මෙම ප්‍රතීතන යෝජනා ක්‍රම ජාත්‍යන්තර මාර්ගෝපදේශවලට අනුකූලව කළමනාකරණය කරන අතර ISO/IEC 17011:2017 අවශ්‍යතාවයන්ද සපුරමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## 5.1. ප්‍රතීතන සේවා

2021 වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පහත දක්වා ඇති පරිදි අනුකූලතා තක්සේරු කිරීමේ ආයතන සඳහා ප්‍රතීතනය ලබා දෙන ලදී.

| ප්‍රතීතන යෝජනා ක්‍රමය | ප්‍රගතිය |
|---|---|
| පරීක්ෂණ රසායනාගාර | නව-04, විෂය පථය දිගු කිරීම් - **09** |
| ක්‍රමාංකන රසායනාගාර | විෂය පථය දිගු කිරීම් - **04** |
| සහතික කිරීමේ ආයතන - නිෂ්පාදන | නව-02 |
| සහතික කිරීමේ ආයතනය - පුද්ගල | නව-**01** |
| සෝදිසි කිරීමේ ආයතන | විෂය පථය දිගු කිරීම් - **01** |
| වෛද්‍ය පරීක්ෂණාගාර | නව-02 |
| නිපුනතා පරීක්ෂණ සේවා ආයතන | නව-02 |
| හරිතාගාරවායු විමෝචන සත්‍යාපනය කිරීමේ ආයතන | නව-02 |

## 5.2. පුහුණු වැඩසටහන්

2021 වසර තුළ, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් බොහෝ ප්‍රතීතන යෝජනා ක්‍රම ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් 17ක් පවත්වා ඇති අතර විවිධ අනුකූලතා තක්සේරු කිරීමේ ආයතන සහ කර්මාන්තවලින් 669 දෙනෙකු පුහුණු කර ඇත. 2021 වර්ෂය තුළ මණ්ඩලය විසින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර ඇමුණුම 05 හි දක්වා ඇත.

## 5.3. අන්තර්ජාතික කටයුතුවලට සහභාගීවීම

මණ්ඩලයේ ප්‍රතීතන යෝජනා ක්‍රම සඳහා ජාත්‍යන්තර පිළිගැනීම පවත්වා ගැනීම සඳහා, සාමාජික සංවිධානයක් ලෙස ජාත්‍යන්තර ප්‍රතීතන සංවිධානවල මධ්‍ය කාලීන සහ වාර්ෂික රැස්වීම්වලදී ගනු ලබන තීරණ සඳහා සහභාගී වීමට සහ දායක වීමට බැඳීමක් ඇත. ඒ අනුව, 2021 තුළ ආසියා පැසිපික් ප්‍රතීතන සහයෝගීතාවයේ (APAC) වාර්ෂික රැස්වීමට සහ ජාත්‍යන්තර ප්‍රතීතන සම්මේලනයේ (IAF) සහ පරීක්ෂණාගාර පිළිබඳ ප්‍රතීතන සහයෝගීතාවය (ILAC) මධ්‍ය කාලීන සහ වාර්ෂික රැස්වීම් සඳහා මාර්ගගත රැස්වීම් ලෙස සහභාගී වී ඇත.

චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය, අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, එල්.එච්.ඩී. බන්දුසෝම නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතීතන) සහ චන්දිකා එදිරිවීර මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතීතන) ආසියා පැසිපික් ප්‍රතීතන සහයෝගීතාවයේ (APAC) වාර්ෂික රැස්වීමට සහභාගී විය.

සියලුම කමිටු රැස්වීම් මාර්ගගතව පවත්වන ලද අතර චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය, අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, එල්.එච්.ඩී. බන්දුසෝම නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතීතන) සහ චන්දිතා එදිරිවීර මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතීතන) රැස්වීමට සහභාගී විය.

ගෝලීය ප්‍රතීතන සංවිධානවල නිල නියෝජිතවරිය ලෙස අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී චන්ද්‍රිකා තිලකරත්න මහත්මිය අන්තර්ජාලය ඔස්සේ ඡන්දය ප්‍රකාශ කිරීමට සහභාගී වූවාය.

ඊට අමතරව ආසියා පැසිපික් ප්‍රතීතන සහයෝගීතාවයේ (APAC) විසින් පත් කරන ලද සම ඇගයීම් සඳහා මණ්ඩලයේ සම ඇගයීම්කරුවන් වන එල්.එච්.ඩී. බන්දුසෝම මයා, චන්දිතා එදිරිවීර මිය, මනීෂා වික්‍රමසිංහ මෙනවිය, මිරීලා ගුණසේකර මෙනවිය සහභාගි වූ අතර, කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් මෙම සමාන්තර ඇගයීම් මාර්ගගතව සිදු කරන ලදී.

# 6. මූල්‍ය තොරතුරු 2021

## 6.1. 2021 වසර සඳහා මූල්‍ය විශේෂ අවස්ථා

පුනරාවර්තන වියදම් සඳහා වාර්ෂිකව වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 75.87 කි. පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර දායකත්වය රුපියල් මිලියන 17.68 කි. සත්‍ය පුනරාවර්තන වියදම රුපියල් මිලියන 54.31 කි. පුනරාවර්තන වියදම්වල හිඟය උපයාගත් ආදායමෙන් පියවීමට කටයුතු කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් එහි ක්‍රියාකාරකම් වලින් ප්‍රධාන වශයෙන් ප්‍රතීතන සේවා සහ පුහුණු වැඩසටහන් වලින් රුපියල් මිලියන 49.35 ක් උපයා ඇත. ආදායම් හා පුනරාවර්තන වියදම් අනුපාතය 90% කි.

2021 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබී නැත. මුළු ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 2.62 ක් වූ අතර සියලු වියදම් මණ්ඩලයේ ඉපැයීම් මගින් දරන ලදී.

| වසර | පුනරාවර්තන වියදම් (රු. මිලියන) | | | | ප්‍රාග්ධන වියදම් (රු. මිලියන) | | |
|---|---|---|---|---|---|---|---|
| | අයවැය වියදම් | සත්‍ය වියදම් | සත්‍ය වියදම් | සත්‍ය වියදම් | සත්‍ය වියදම් | භාණ්ඩාගාර දීමනා | ඉපැයීම් |
| 2007 | 14.70 | 11.50 | 8.23 | 2.83 | 1.50 | 1.40 | 1.50 |
| 2008 | 17.29 | 13.98 | 10.56 | 3.27 | 2.74 | 0.41 | 0.50 |
| 2009 | 19.60 | 15.01 | 11.47 | 3.32 | 2.33 | 0.44 | 0.66 |
| 2010 | 21.81 | 15.51 | 8.91 | 5.30 | 3.57 | 0.63 | 0.50 |
| 2011 | 23.30 | 21.33 | 13.28 | 8.12 | 3.08 | 0.63 | 0.80 |
| 2012 | 28.18 | 29.29 | 15.50 | 12.9 | 1.82 | 1.75 | 1.37 |
| 2013 | 33.00 | 36.61 | 14.80 | 18.08 | 2.00 | 1.51 | 1.50 |
| 2014 | 38.00 | 42.85 | 16.09 | 27.58 | 2.00 | 1.71 | 1.73 |
| 2015 | 64.50 | 63.14 | 12.20 | 55.24 | 3.00 | 1.64 | 1.25 |
| 2016 | 56.00 | 49.43 | 15.70 | 31.74 | 5.20 | 4.67 | 2.00 |
| 2017 | 60.5 | 57.91 | 16.16 | 36.03 | 2.00 | 2.05 | 0.91 |
| 2018 | 66.0 | 59.79 | 17.06 | 45.23 | 4.25 | 3.64 | - |
| 2019 | 71.8 | 66.67 | 19.49 | 47.43 | 6.92 | 2.43 | 1.4 |
| 2020 | 72.70 | 51.50 | 19.64 | 37.08 | 3.69 | 1.97 | 0.5 |
| 2021 | 75.87 | 54.31 | 17.68 | 49.35 | 6.65 | 2.62 | - |

## 6.2. 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

# අනුකූලතා තක්සේරුව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

# 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

| වත්කම් | සටහන් | සත්‍ය 2021 රු. | සත්‍ය 2020 රු. |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමාන | 19 | 42,912,083.29 | 30,459,855.03 |
| දේශීය මිලදී ගැනීම් අත්තිකාරම් | | - | - |
| ලැබිය යුතු දේ | 11 | 12,769,896.28 | 4,752,305.00 |
| මුද්දර | | 15,000.00 | 15,000.00 |
| ලිපි ද්‍රව්‍ය තොගය | | 227,757.88 | 255,680.69 |
| පෙර ගෙවීම් | 17 | 538,316.66 | 129,040.80 |
| ගෙවිය යුතු NBT | | 32,557.83 | 32,557.83 |
| වැටුප් පාලනය | | - | 7,622.00 |
| උත්සව අත්තිකාරම් | | 50.00 | - |
| වැට් බදු පාලනය | | 175,959.01 | 175,959.01 |
| ආපදා ණය | 16 | 906,200.00 | 1,224,400.00 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු සහ අත්තිකාරම් | 10 | 3,520,500.00 | 3,520,500.00 |
| | | 61,098,320.95 | 40,572,920.39 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල කම්හල සහ උපකරණ | 31 | 9,528,852.38 | 9,925,358.63 |
| ආපදා ණය | 16 | 518,301.12 | 1,478,346.12 |
| **අස්පෘශ්‍ය වත්කම්** | | | |
| බුද්ධිමය දේපල සහ සංවර්ධන ක්‍රියාකාරකම් | 18 | 320,746.00 | 364,895.01 |
| පාරිතෝෂික සඳහා ආයෝජනය | | 3,554,552.17 | 3,376,551.64 |

| | | | |
|---|---|---|---|
| | | 13,922,451.67 | 15,145,151.40 |
| <u>**මුළු වත්කම්**</u> | | **75,020,772.62** | **55,718,071.79** |
| | | | |
| <u>**වගකීම්**</u> | | | |
| | | | |
| ජංගම වගකීම් | | | |
| වෛද්‍ය රක්ෂණය | | - | 750.00 |
| ණය හිමියන් | **23** | 829,509.20 | 683,863.42 |
| උපචිත සහ අනෙකුත් ගෙවිය යුතු දේ | **14** | 6,521,788.91 | 3,570,621.28 |
| වාර්ෂික නිවාඩු සඳහා ප්‍රතිපාදන | | 790,837.85 | 603,841.67 |
| අත්තිකාරම් ලැබීම් | **27** | 976,000.00 | 339,304.35 |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | | - | - |
| උපචිත සහ අනෙකුත් ගෙවිය යුතු දේ | | **9,118,135.96** | **5,198,380.72** |
| <u>**ජංගම නොවන වගකීම්**</u> | | | |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | **24** | 5,115,650.00 | 5,311,154.50 |
| **මුළු වගකීම්** | | **14,233,785.96** | **10,509,535.22** |
| | | | |
| **ශුද්ධ වත්කම්** | | **60,786,986.66** | **45,208,536.57** |
| | | | |
| | **12** | 50,568,765.38 | 55,628,074.35 |
| ශුද්ධ වත්කම් / කොටස් | **13** | 7,793,973.28 | (12,234,137.78) |
| සමුච්චිත අරමුදල | **20** | 2,424,248.00 | 1,814,600.00 |
| | | | |
| **ශුද්ධ වත්කම් / කොටස්** | | **60,786,986.66** | **45,208,536.57** |

පිටු 5 සිට 8 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 9 සිට 14 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා සභා සාමාජිකයන් වගකිව යුතුය. මෙම මූල්‍ය වාර්තාවට මණ්ඩලයේ පාලක සභාව වෙනුවෙන් අත්සන් කර ඇත.

………………………………………………………………

ආර්.එම්.එස්.පී.එස් බණ්ඩාර

සභා සාමාජික

මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින්

………………………………………………

ආචාර්ය සිද්ධික සේනාරත්න

සභා සාමාජික

………………………………………………………………..

චන්ද්‍රිකා තිලකරත්න

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

………………………………………………

කේ.එච්.එන් චන්ද්‍රසිරි

වැඩ බලන-සහකාර අධ්‍යක්ෂ (මුදල්/පරිපාලන)-

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

## 6.3. 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

**2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | සත්‍ය 2021 රු. | සත්‍ය 2020 රු. | අයවැය |
|---|---|---|---|---|
| ආදායම | **1** | **68,830,156.17** | **61,760,518.61** | **75,876,000.00** |
| මුළු ආදායම | | **68,830,156.17** | **61,760,518.61** | **75,876,000.00** |
| පරිපාලන සහ ආයතන වියදම් | | | | |
| පුද්ගල පඩි නඩි | **2** | 22,672,903.93 | 22,991,533.86 | 31,425,900.00 |
| ගිවිසුම්ගත සේවා | **6** | 19,654,084.88 | 17,489,168.26 | 30,006,000.00 |
| සැපයුම් | **4** | 695,495.36 | 1,711,047.38 | 900,000.00 |
| දායකත්ව සහ සාමාජික ගාස්තු | **7** | 2,145,876.35 | 1,772,429.82 | 2,174,100.00 |
| ගමන් වියදම් | **3** | 831,963.22 | 324,110.94 | 4,200,000.00 |
| නඩත්තු වියදම් | **5** | 4,062,806.68 | 2,047,728.91 | 5,100,000.00 |
| වෙනත් | **8** | 4,229,606.29 | 5,136,494.76 | 1,730,000.00 |
| මූල්‍ය පිරිවැය සහ වෙනත් | **9** | 12,720.00 | 5,000.00 | 0.00 |

| | | | |
|---|---|---|---|
| අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන්කිරීම් | - | - | 1,000,000.00 |
| මුළු වියදම | **54,305,456.71** | **51,477,513.93** | **75,876,000.00** |
| වියදමට වැඩි වූ අතිරික්තය | **14,524,699.46** | **10,283,004.68** | - |

## 6.4. 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

**2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය**

| | විලම්භිත ආදායම | වෙනත් දීමනා | සමුච්චිත අරමුදල | සමස්ත |
|---|---|---|---|---|
| **2020 ජනවාරි 1 වන දිනට ශේෂය** | **5,983,838.80** | **1,814,600.00** | **37,295,760.12** | **45,094,198.92** |
| පෙර වසර ගැලපීම | - | - | - | - |
| 2020 ජනවාරි 1 වන දිනට ශේෂය | 5,983,838.80 | 1,814,600.00 | 37,295,760.12 | 45,094,198.92 |
| ප්‍රාග්ධන වත්කම් සඳහා ලැබුණු සහ භාවිතා කරන ලද ප්‍රදානය | 500,000.00 | | - | 500,000.00 |
| වර්ෂය සඳහා ක්ෂයවීම් වියදම් | (4,028,271.67) | | - | (4,028,271.67) |
| ස්ථාවර වත්කම් ලෙස ගෙන ඇති වත්කම් | - | | | (108,832.61) |
| ප්‍රතීතන ලැබිය යුතු ආදායම් ගැලපීම | | | | (259,200.00) |
| ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන් ක්‍රමක්ෂ කිරීම | (88,298.01) | | | (88,298.01) |
| පුහුණු ලැබිය යුතු ආදායම් ගැලපීම | | | | (42,244.89) |
| මෝටර් රථ ක්ෂයවීම් ගැලපීම සකසන්න | | | | 8,683,333.34 |
| ක්ෂයවීම් ගැලපීම | - | | | (14,825,153.19) |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය). | | | 10,283,004.68 | 10,283,004.68 |
| **ශේෂය 2020දෙසැම්බර් 31 දිනට** | **2,367,269.12** | **1,814,600.00** | **47,578,764.80** | **45,208,536.57** |
| **2021 ජනවාරි 1 වන දිනට ශේෂය** | 2,367,269.12 | 1,814,600.00 | 47,578,764.80 | 45,208,536.57 |
| ප්‍රාග්ධන වත්කම් සඳහා ලැබුණු සහ භාවිතා කරන ප්‍රදානය | | 609,648.00 | - | 609,648.00 |

| | | | | |
|---|---|---|---|---|
| සහතික කරණ ආයතනවලින් ලැබිය යුතු ආදායම ගැලපීම | | | - | (6,812.96) |
| රසායනාගාරවලින් ලැබිය යුතු ආදායම ගැලපීම | - | | | 146,000.00 |
| ක්‍රමාංකනාගාරවලින් ලැබිය යුතු ආදායම ගැලපීම | | | | 160,000.00 |
| පරීක්ෂණ ආයතනවලින් ලැබිය යුතු ආදායම ගැලපීම | | | | 80,000.00 |
| රක්ෂණ ගාස්තුව ගැලපීම | | | | 64,915.59 |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය). | | | 14,524,699.46 | 14,524,699.46 |
| ශේෂය 2021 දෙසැම්බර් 31 දිනට | **2,367,269.12** | **2,424,248.00** | **62,103,464.26** | **60,786,986.66** |

## 6.5. 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

<u>අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය</u>

<u>**2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**</u>

| විස්තර | 2021 | 2020 |
|---|---|---|
| | රු. | රු. |
| <u>වසර සඳහා අතිරික්තය</u> | 14,524,699.46 | 10,283,004.68 |
| <u>ගැලපීම්;</u> | | |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (753,555.28) | (6,642,821.30) |
| ස්ථාවර වත්කම්වල ක්ෂයවීම් | 3,629,620.20 | 4,028,271.67 |
| පාරිතෝෂිත වෙන්කිරීම | 26,560.50 | 1,619,076.50 |
| වාර්ෂික නිවාඩු සඳහා වෙන් කිරීම | 548,994.25 | 603,841.67 |
| පාරිතෝෂිත ගෙවීම | 222,065.00 | - |
| පාරිතෝෂිත ආයෝජනයෙන් පොලී | 178,000.53 | 303,333.45 |
| ප්‍රවීණතා පරීක්ෂණ ක්‍රමක්ෂ කිරීම | 44,149.01 | 88,298.01 |
| ගිණුම්කරණ පැකේජය ක්‍රමක්ෂ කිරීම | - | - |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය** | **18,420,533.67** | **10,283,004.68** |
| <u>කාරක ප්‍රාග්ධන වෙනස්කම්</u> | | |
| <u>උත්සව අත්තිකාරම්</u> අඩු කිරීම / (වැඩිවීම). | **(50.00)** | |
| කලින් ලැබුණු අඩු කිරීම / (වැඩිවීම). | 636,695.65 | |
| පෙරගෙවුම් වල අඩු කිරීම /(වැඩිවීම). | (344,360.27) | 20,096.82 |
| වෛද්‍ය රක්ෂණයේ වැඩිවීම/(අඩුවීම). | (750.00) | (1,650.00) |
| ලැබිය යුතු මුදල් අඩු කිරීම /(වැඩිවීම). | (7,638,404.20) | 4,728,264.28 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු වැඩි කිරීම/(අඩු වීම). | - | (1,324,800.00) |
| ණය හිමියන්ගේ වැඩි වීම/(අඩුවීම). | 145,645.78 | 153,616.89 |
| වාර්ෂික නිවාඩු ප්‍රතිපාදන වැඩි කිරීම/(අඩු වීම). | 186,996.18 | 241,843.60 |
| වැටුප් පාලනය වැඩි කිරීම/(අඩු වීම). | 7,622.00 | (7,622.00) |
| උපචිත වියදම් වැඩි කිරීම/(අඩු වීම). | 2,951,225.43 | (1,199,781.26) |
| තොගයේ සහ අනෙකුත් අයිතමවල වැඩි කිරීම/(අඩු වීම). | 27,922.81 | (25,416.00) |
| ගෙවිය යුතු අනෙකුත් වැඩිකිරීම්/(අඩුවීම). | (57.80) | (692,265.75) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | **14,393,019.25** | **12,175,291.26** |

| | | |
|---|---|---|
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම</u> | | |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | (2,623,465.96) | (1,794,376.60) |
| SLAB ගිණුම්කරණ පැකේජය | - | (139,500.00) |
| වර්ෂය තුළ ආපදා ණය ප්‍රදානය කරන්න | - | (1,950,000.00) |
| වර්ෂය තුළ ආපදා ණය අයකර ගැනීම | 1,278,245.00 | 1,438,780.40 |
| පාරිතෝෂික සඳහා ගෙවීම | (222,065.00) | - |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | (195,504.50) | 1,619,076.50 |
| පාරිතෝෂික ආයෝජනයෙන් පොලී | (178,000.53) | (303,333.45) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ශුද්ධ මුදල්** | **(1,940,790.99)** | **(1,129,353.15)** |
| | | |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා එම</u> | | |
| රජයේ ආධාර ලැබිණි | - | 500,000.00 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල භාවිතා කරන ශුද්ධ මුදල්** | **-** | **500,000.00** |
| මුදල් සහ මුදල් සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම/අඩුවීම | 12,452,228.26 | 11,545,938.11 |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන මුදල් | 30,459,855.03 | 18,913,916.92 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන මුදල්** | **42,912,083.29** | **30,459,855.03** |

## 6.6. මූල්‍ය ප්‍රකාශනයේ සටහන්

**අනුකූලතා තක්සේරුව සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

1.1 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති.

පොදු

අනුකූලතා තක්සේරු සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යනු 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකාව සඳහා වන ජාතික ප්‍රතීතන අධිකාරියයි.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, බොරැල්ල, කිතුල්වත්ත පාර, 104/A හි පිහිටා ඇත.

1.2 සකස් කිරීමේ සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල පදනම.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 3/2013 අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS 1)

2021 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ දරයි.

1.2.2 අඛණ්ඩ පැවැත්ම

පාලක සභාව විසින් ශ්‍රී ලංකා අධ්‍යක්ෂ මණ්ඩලයට අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර ඔවුන් ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් නොකරයි.

1.2.3 දායක සැලසුම් නිර්වචනය

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

නීති රීති සහ රෙගුලාසිවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් EPF සහ ETF සඳහා පිළිවෙළින් දළ වැටුපෙන් 15% සහ 3% දායක වේ. EPF සහ ETF වෙත ලැබෙන සියලුම ප්‍රේෂණ කිසිදු හිඟයකින් තොරව නියමිත වේලාවට සිදු කර ඇත.

1.3. වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

ශේෂ පත්‍ර දිනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත මුදල් වශයෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වන ඒවා වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් යනු ශේෂ පත්‍ර දින සිට වසරක කාල සීමාවකට ඔබ්බෙන් තබා ගැනීමට මණ්ඩලය අදහස් කරන ඒවා ජංගම නොවන වත්කම් වේ.

සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ පෙන්වා ඇති ප්‍රවීණතා පරීක්ෂණ වැඩසටහන් වියදම් වසර ආරම්භයේදී එහි ගෙන ගිය ඉදිරි ශේෂයෙන් 50%ක් ක්‍රමක්ෂ කර ඇත.

1.3.1 දේපල යන්ත්‍ර සහ උපකරණ

දේපල යන්ත්‍ර සහ උපකරණ පිරිවැය ක්‍රමයට දක්වා ඇත. එවැනි වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ පිරිවැය කපා හැරීම සඳහා පහත සඳහන් වාර්ෂික ගාස්තු යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂයවීම් ලබා දී ඇත.

| වත්කම අනුපාතය | වත්කම් කෂය |
|---|---|
| මෝටර් රථය | 12.5% |
| ගෘහභාණ්ඩ | 20% |
| කාර්යාල උපකරණ, දුරකථන සහ ෆැක්ස් යන්ත්‍රය | 20% |
| වායු සමීකරණ සහ ශීතකරණ ඒකක | 12.5% |
| පරිගණකය, මුද්‍රණ යන්ත්‍රය, බහුමාධ්‍ය ප්‍රොජෙක්ටරය සහ ඡායාරූප | |
| පිටපත් යන්ත්‍ර | 25% |
| ගොඩනැගීම සහ ව්‍යුහය | 33.33% |

වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ වත්කම භාවිතයට ඇති විට වන අතර බැහැර කිරීම සඳහා හඳුනාගෙන ඇති වසර අවසානයේ නතර වේ. වසර අවසානයේ බැහැර කිරීමට හඳුනාගෙන ඇති ඕනෑම වත්කමක්, එම අයිතමයන් ඒ දක්වා ක්ෂය කරනු ලැබේ. රුපියල් 5,000 කට වැඩි වටිනාකමක් ඇති භාණ්ඩ ස්ථාවර වත්කම් ලෙස සලකනු ලබන අතර අනෙකුත් ඒවා පරිභෝජන භාණ්ඩ ලෙස සැලකේ.

1.3.2 අස්පෘශ්‍ය වත්කම්

ශ්‍රී ලංකාවේ ගුණාත්මක යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ස්වීඩන් රජයෙන් ප්‍රදානයක් ලෙස S ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල වෙබ් අඩවිය සහ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල තොරතුරු තාක්ෂණ පද්ධතිය සඳහා මෘදුකාංග සත්කාරකත්වය ලබාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය 2010 වසර අවසානයේ අවසන් කර ඇත. මෙම ප්‍රාග්ධන පිරිවැය ජංගම නොවන වත්කම් ලෙස පිළිගෙන ඇති අතර යම් යම් වෙනස් කිරීම් සිදු කරන ලද බැවින් 2013 සිට ආරම්භ වී වසර 5ක් ඇතුළත ක්‍රමක්ෂ කිරීමට තීරණය කර ඇත.

1. 4 තොග භාණ්ඩ

තොග අයිතමයන් නොමැති අතර ලිපි ද්‍රව්‍ය පමණක් පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු වටිනාකමකට අගය කර ඇත.

1.5 ලැබිය යුතු දේ

ලැබිය යුතු දෑ ඇස්තමේන්තු ගත උපලබ්ධි අගයට සටහන් කර ඇත.

1.6. වගකීම් සහ වෙන් කිරීම්

1.6.1 ජංගම වගකීම්

ජංගම වගකීම් යනු ඉල්ලුම මත හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත ගෙවීම් සඳහා ගෙවිය යුතු ඒවා වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

1.7 ආදායම සහ වියදම්

1.7.1 ආදායම් හඳුනාගැනීම

පුහුණු වැඩසටහන සහ ප්‍රතීතන යෝජනා ක්‍රම වලින් ලැබෙන ආදායම උපචිත පදනම මත ගණනය කෙරේ. කෙසේ වෙතත්, ප්‍රතීතනය ලබා දීමෙන් පසු වසර තුනක කාලයක් සඳහා වාර්ෂික ප්‍රතීතන ගාස්තුව අය කරනු ලබන අතර වසර 03කට පෙර නැවත ඇගයීම සිදු කළ යුතුය. ප්‍රතීතන සහතිකය ප්‍රදානය කිරීමේදී 1 වන වසර සඳහා වාර්ෂික ගාස්තුවක් අය කරනු ලබන අතර ප්‍රදානය කළ වර්ෂය සඳහා ආදායම ලෙස සම්පූර්ණයෙන්ම සලකනු ලබන අතර 2 වන සහ 3 වන අලුත් කිරීම සඳහා එම පරිචය දිගටම කරගෙන යන්න.

ලැබීම් පදනම මත ආදායම් ප්‍රකාශයේ දීමනා හඳුනාගෙන ඇත.

### 1.7.2 භාණ්ඩාගාර ප්‍රදාන

මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදන අදාළ කාලපරිච්ඡේදයේ හඳුනාගත් වියදම් වලට එරෙහිව ලැබෙන ආදායම් ලෙස හඳුනාගන්නා අතර ප්‍රාග්ධන ප්‍රතිපාදන වත්කම් අත්පත් කර ගැනීමේ විලම්බිත ආදායම් ලෙස අවත්කම් වල අගයට එකතුවීමක් ලෙස හඳුනාගැනේ.

### 1.7.3 වියදම් හඳුනාගැනීම

මණ්ඩලය පවත්වාගෙන යාමට සහ දේපල, කම්හල සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමට දරන ලද සියලුම වියදම් ආදායම් ප්‍රකාශය වෙත අය කර ඇත.

### 1.8 බදු අය කිරීම

ආදායම් බදු සඳහා වෙන් කිරීම් සිදු කර නැත.

### 1.9 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම හෝ ගැලපීම අවශ්‍ය වන සිදුවීම් කිසිවක් සිදු නොවිය.

### 1.10 සංසන්දනාත්මක සංඛ්‍යා

ප්‍රවර්තන වර්ෂය සහ සංසංදනාත්මක පෙර වර්ෂයේ සංඛ්‍යා දත්ත ඉදිරිපත් කර ඇත.

### 1.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රම භාවිතා කර සකස් කර ඇත.

දේපල කම්හල සහ උපකරණ මිලදී ගැනීම සම්බන්ධ රජයේ ප්‍රදාන ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කෙරේ.

### 1.12 විදේශ විනිමය ඉපැයීම

වසර තුළ විදේශීය ප්‍රතීතන සේවා වලින් උපයා ඇති ආදායම නිෂ්පාදන සහතිකය මගින් USD 27,534.45 වේ. ආදායමේ රුපියලේ වටිනාකම රුපියල් 5,444,192.93 කි

### 1.13 විදේශ විනිමය ඉපැයීම් සඳහා ගිණුම්කරණය

විදේශ ගනුදෙනු සඳහා වෙනම FEEA ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රොෆෝමා ඉන්වොයිසියක් ඩොලර් හෝ යුරෝ ආකාරයෙන් FEEA වෙත ඉපැයීම් එකතු කිරීම සඳහා යවනු ලැබේ. එම තැන්පතු FEEA A/C එකතු කර මුදල් ප්‍රවාහ අවශ්‍යතාවයට අනුව ජංගම ගිණුමට මාරු කරනු ලැබේ. විදේශ විනිමය ගනුදෙනුවලින් ලැබෙන ලාභය හෝ අලාභය FEEA A/C සිට වත්මන් A/C දක්වා මුදල් ආපසු ගැනීමේදී හඳුනා ගැනේ.

### 1.14 පාරිතෝෂිත දීමනාව

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන් විසින් හඳුන්වා දෙන ලද සූත්‍රයට අනුව පාරිතෝෂික ප්‍රතිපාදන සිදු කර ඇති අතර එය දැන් භාවිතා කිරීම නිර්දේශ නොවන බැවින් එක් එක් සේවකයා විසින් සම්පූර්ණ කරන ලද මුළු වසර ගණන සැලකිල්ලට ගනිමින් අපි ප්‍රතිපාදන ගණනය කළෙමු. අපේක්ෂිත අවශ්‍යතා සහ අරමුදල් ලබා ගැනීමේ හැකියාව අනුව රාජ්‍ය බැංකුවක හෝ භාණ්ඩාගාර බිල්පත්වල ස්ථාවර තැන්පතු සඳහා අරමුදල් ආයෝජනය කෙරේ. පාරිතෝෂිත දීමනා ලැබීමට හිමිකම් ඇති සියලුම සේවකයින් ආයෝජනයෙන් සම්පූර්ණයෙන්ම ආවරණය වේ.

